අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/08/26/06/08/02 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2023.03. 03

**චක්‍රලේඛ අංක - 05/2023**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත්/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම පළාත්/ කලාප ගණකාධිකාරීවරුන්,

සියලු ම විදුහල්පතිවරුන්,

**<u>ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මගින් පාසල් හා පරිගණක මධ්‍යස්ථානවල පරිගණක ආශ්‍රිත උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව සම්බන්ධයෙන් ජාතික මට්ටමේ වැඩපිළිවෙලක් 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහනට අදාළ චක්‍රලේඛ හා උපදෙස් ලිපි විවිධ අවස්ථාවන්හි දී නිකුත් කර ඇත.

02. වර්තමානයේ සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සුවිශේෂී වූ කාර්යභාරයක් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉටුකරමින් පවතින අතර මෙම කටයුතු වඩා කාර්යක්ෂමව, විනිවිදභාවයකින් හා ප්‍රශස්තව සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර ඇත. එම මාර්ගෝපදේශ සංග්‍රහය මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇත. මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුකූලව සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල් අධ්‍යාපනයට අදාළ යටිතල පහසුකම් සංවර්ධන කාර්යය ඉටු කළ යුතු වේ.

03. මෙම විෂයය සම්බන්ධව පවතින පහත සඳහන් චක්‍රලේඛ හා උපදෙස් ලිපි තවදුරටත් පහත පරිදි බලාත්මක වේ.

i. 2008.04.04 දිනැති චක්‍රලේඛ අංක 2008/14 පාසල් පරිගණක විද්‍යාගාරවල පරිගණක ආශ්‍රිත දෘඩාංග ගැටළු විසඳා ගැනීමේ චක්‍රලේඛය.

ii. ED/01/26/07/01/01 හා 2010.09.16 දිනැති කලාප මට්ටමින් පිහිටුවා ඇති දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම් සාමාජිකයන් කලාප හා පළාත් තාක්ෂණික ඇගයීම් කටයුතුවලට සම්බන්ධ කර ගැනීමේ උපදෙස් ලිපියේ "දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම් හා සාමාජිකයන්" වෙනුවට "කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම් සාමාජිකයන්" ලෙස සංශෝධනය විය යුතුය.

iii. චක්‍රලේඛ අංක 2010/23 හා 2010.06.28 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිගණක අලුත්වැඩියා කිරීමට අදාළව තත්ත්ව වාර්තා සඳහා භාවිත කරනු ලබන ආකෘතියට අමතරව මේ කාර්යය සඳහා භාවිතා කරනු ලබන මාර්ගගත පද්ධතිය මඟින් ලබාදෙන තත්ත්ව වාර්තාව ද වලංගු වාර්තාවක් ලෙස භාවිත කළ හැකිය.

04. තවද, මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ මේ සම්බන්ධව නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛ/ උපදෙස් ලිපි අභිභවා මෙම චක්‍රලේඛය හා මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් බලාත්මක වේ.

i. 2007.06.07 දිනැති ED/01/26/02/46/01 දිනැති උපදෙස් ලිපිය.

ii. 2008.04.08 හා ED/01/26/07/01/01 දිනැති උපදෙස් ලිපිය.

එම්.එන්. රණසිංහ

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

01. විගණකාධිපති

02. සියලු ම අතිරේක ලේකම්වරුන්/ අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය

03. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය

04. සියලු ම පළාත් / කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්

05. සියලුම තොරතුරු තාක්ෂණ දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන උපදේශකවරුන්

<u>ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන මාර්ගෝපදේශ සංග්‍රහය</u>

ඩිජිටල් අධ්‍යාපන පරිවර්තනය ඉතා සංකීර්ණ කාර්යභාරයකි. එම සංකීර්ණ කාර්යභාරය තුළ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමුඛ අවශ්‍යතාවයකි. සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සැලකීමේදී, දිවයින පුරා විසිරී පවතින පාසල් 10,155 ප්‍රමාණයකින් යුක්ත පාසල් පද්ධතියට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත්/කලාප/කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ඇතුළු අධ්‍යාපන පරිපාලනයට සම්බන්ධ ආයතන මෙන්ම ජාතික විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ඉංග්‍රීසි ඉගෙනුම් මධ්‍යස්ථාන, තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන ඇතුළු විශාල ආයතන ප්‍රමාණයක ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යාවශ්‍ය වේ.

මෙම ඩිජිටල් අධ්‍යාපන පහසුකම් ප්‍රවර්ධනය තුළ බලාපොරොත්තු වන ප්‍රමුඛ අපේක්ෂාවන් නම්

1. අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීම.
2. අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම.
3. පරිපාලනය හා කළමනාකරණ භාවිතයන් සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම.
4. අධ්‍යාපන තොරතුරු පද්ධති පවත්වාගෙන යාම.
5. අධ්‍යාපන ආයතන තුළ සුහුරු තාක්ෂණය හා තොරතුරු තාක්ෂණ භාවිතයන් සහ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම වේ.

වර්තමානයේ ඩිජිටල් අධ්‍යාපනය සම්බන්ධිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දරනු ලබන ඉහළ පිරිවැය ඵලදායීව භාවිතා කිරීමටත්, අදාළ සම්පත් ප්‍රශස්ථව හා යාවත්කාලීනව භාවිතා කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ අපේක්ෂා වේ. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් යටතට සියලුම පරිගණක හා ආශ්‍රිත උපාංග, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ජාල උපාංග, අන්තර්ජාල සැපයුම් උපාංග, ඩිජිටල් පුවරු හා උපාංග ඇතුළු ඩිජිටල් අධ්‍යාපනයට, පරිපාලනයට හා කළමනාකරණයට සම්බන්ධිත සියලු ඩිජිටල් උපාංග ඇතුළත් වේ.

මේ සඳහා ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සාධාරණ ලෙස සැපයීම, ප්‍රශස්ත භාවිතය, නිසි නඩත්තුව, අලුත්වැඩියාව හා පරිසර හිතකාමීව ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ඉවත්කිරීම යන ප්‍රමුඛ අවශ්‍යතා ඉටු කිරීම අත්‍යාවශ්‍ය වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප/කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ඇතුළු අධ්‍යාපන පරිපාලනයට සම්බන්ධ ආයතන, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන, ප්‍රාදේශීය ඉංග්‍රීසි ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන, තොරතුරු තාක්ෂණ හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන සහ සියලු රජයේ පාසල් සඳහා ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන මාර්ගෝපදේශ සංග්‍රහය අදාළ වේ.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය පහත පරිච්ඡේදවලින් යුක්ත වේ.

01. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සම්පාදනය
02. ඩිජිටල් උපාංග අලුත්වැඩියාව
03. ඩිජිටල් උපාංග අපහරණය කිරීම.
04. පළාත්/කලාප ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම
05. කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම
06. පාසල් ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම
07. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් නඩත්තු හා අලුත්වැඩියා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
08. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් නඩත්තු තොරතුරු පවත්වාගෙන යාම.

## 01. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සම්පාදනය

1. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සැපයීම වඩාත් විනිවිද භාවයකින් යුක්තව, සමානාත්මතාවය ඇතිවන ආකාරයට සිදු කළ යුතුවේ. මේ සඳහා අදාළ අවම ප්‍රමිතීන්වලට අනුකූල වනසේ සෑම දරුවෙකුටම ඩිජිටල් අධ්‍යාපනය ලැබෙන පරිදි ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය කළ යුතුය.
2. පාසල්වලට අදාළව සකස් කරනු ලබන අවම ප්‍රමිතීන්වලට හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස්කර යාවත්කාලීන කරනු ලබන පිරිවිතරයන්ට අනුකූලව අදාළ සම්පත් සැපයීම සිදුකළ යුතුවේ.
3. සියලුම ඩිජිටල් උපාංග සැපයීමකට අදාළව පිරිවිතර හා සැපයුම්කරු පිළිබඳව විස්තර හා වගකීම් කාලය තුළ අලුත්වැඩියා කිරීම පිළිබඳ තොරතුරු අදාළ පාසල්/ අධ්‍යාපන ආයතන වෙත ලබාදිය යුතුය.
4. මෙම සැපයීම් සාධාරණීකරණය වීම සඳහා නිශ්චිත තොරතුරු මත පදනම්ව අවශ්‍යතාවය හඳුනාගෙන එම සැපයීම් සිදුකළ යුතුවේ.
5. රජය මගින් සපයනු ලබන ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් වලට පරිබාහිරව,පාසල්, අධ්‍යාපන ආයතන වෙත ලැබෙන සම්පත්ද, රජය සතු සම්පත් බවට පත්වන අතර එම ඩිජිටල් යටිතල පහසුකම් පිළිබඳවද භාණ්ඩ වට්ටෝරු පොතේ හා අදාළ ලේඛන වලට ඇතුළත් කළ යුතුය.

## 02. ඩිජිටල් උපාංග අලුත්වැඩියාව

1. පරිගණක, පරිගණක ජාලයන් හි හා වෙනත් උපාංගවල වගකීම් කාලය තුළ සැපයුම්කරු විසින් අලුත්වැඩියා කටයුතු සිදුකළ යුතුය.
2. වගකීම් කාලය අවසන් වූ පසු සිදු කරනු ලබන සියලුම අලුත්වැඩියාවන් කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම මගින් සිදුකළ යුතුය.

3. කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායමට අලුත්වැඩියා කටයුතු සිදුකිරීම දුෂ්කර අවස්ථාවලදී, එම කණ්ඩායමේ නිර්දේශය මත අදාළ උපාංග පිළිබඳව ජාතික මට්ටමේ ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායමේ හෝ අදාළ සැපයුම් ආයතනයෙන් සහය ලබාගත යුතුය.
4. පාසලේ පවතින පරිගණක හා ජාලකරණ උපාංගවල දෝෂ පවතී නම් එම දෝෂ ලිඛිතව දුරකථනය මගින්, සමාජමාධ්‍ය මගින්, විද්‍යුත් තැපැල මගින් හෝ ඉදිරියේදී සංවර්ධනය කරනු ලබන මාර්ගගත පද්ධතිය භාවිතාකර විදුහල්පති විසින් කලාපීය ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ඒකකය වෙත නොපමාව දැනුම්දිය යුතුය.

## 03. ඩිජිටල් උපාංග අපහරණය කිරීම

1. අලුත්වැඩියා කිරීම් සිදුකළ නොහැකි පරිගණක හා පරිගණක ජාලකරණ උපාංග බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කිරීම සිදුකළ යුතු අවස්ථා වලදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට පෙර කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ (ZDETT) කණ්ඩායමේ හෝ අදාළ ආයතනයේ (DETT) නිර්දේශය ලබා ගැනීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුය.
2. මෙම ඉවත් කිරීමට නිර්දේශ වන භාණ්ඩ ඉවත් කිරීම සඳහා මාර්ගගත පද්ධතිය ලබා දෙන ආකෘතිය මගින් කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගේ නිර්දේශ සහිතව පළාත්/ කලාප හෝ අදාළ ආයතනයේ තොරතුරු තාක්ෂණ විෂයභාර අධ්‍යක්ෂ/ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධන අධ්‍යක්ෂ/නි.අ.අ./ස.අ.අ අනුමැතිය ලබාගත යුතුය.
3. හැකි සෑම විටම අපහරණය කරනු ලබන උපකරණවලට අදාළව එම උපකරණවල තවදුරටත් භාවිතයට ගත හැකි උපාංග කොටස් පවතීනම්, එම උපාංග කොටස් ඉවත්කර ගෙන අදාළ ආයතනයේ ඩිජිටල් අධ්‍යයන යටිතල පහසුකම් ඒකකය තුළ ගබඩාකර, අවශ්‍ය පාසල්වල හෝ ආයතනවල අලුත්වැඩියාව සඳහා ලබාදිය යුතුය. මේ සම්බන්ධ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම සිදුකළ යුතුය.
4. භාණ්ඩ සමීක්ෂණයේදී පරිගණක හා ඊට අදාළ උපාංග බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කිරීමේ හැකියාව පවතින්නේ අදාළ ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායමේ නිර්දේශය සහිතව අදාළ ආයතනයේ තොරතුරු තාක්ෂණ විෂයභාර අධ්‍යක්ෂ/ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධන අධ්‍යක්ෂ/නි.අ.අ./ස.අ.අ අනුමැතිය මත පමණි.

## 04. පළාත්/කලාපීය ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම.

1. පාසල් හා අධ්‍යාපන ආයතනවල ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්යය තුළ අදාළ කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය හා තාක්ෂණික සහය ලබාදීම සඳහා ස්ථාවර කේන්ද්‍රීය මධ්‍යස්ථාන පැවතීම අත්‍යාවශ්‍ය වේ.
2. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ස්ථාපිත කරනු ලබන ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ශාඛාවට අනුබද්ධව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු/කලාප අධ්‍යාපන කාර්යාල ඇතුළු ප්‍රමුඛ අධ්‍යාපන පරිපාලන ව්‍යුහයන් තුළ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් ඒකකයක් ස්ථාපිත කළ යුතුවේ. දැනට මෙම ආයතන වල 2011-06-21 දිනැති 2011/20 චක්‍රලේඛ ප්‍රකාරව තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපිතව පවතී නම් එයට අනුබද්ධව මෙම ඒකකයද පිහිටුවිය යුතුවේ.
3. මෙම ඒකකය පළාත්/කලාපීය තොරතුරු තාක්ෂණ විෂයභාර නි.අ.අ./ස.අ.අ හෝ තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරි යටතේ ස්ථාපිත විය යුතුය.
4. මෙම ඒකකයේ රාජකාරි කටයුතු සඳහා සංවර්ධන නිලධාරි සේවයේ/තොරතුරු තාක්ෂණ සේවයේ හෝ කළමනාකරණ නිලධාරි සේවයේ යන සේවාවන්වල නිලධාරීන් දෙදෙනෙකුවත් පූර්ණකාලීනව අනුයුක්ත කළ යුතුවේ.
5. මෙයට අමතරව කලාපීය/කොට්ඨාශ තොරතුරු තාක්ෂණ ගුරු උපදේශකවරු සේවයේ නියුක්ත නම් ඔවුන්ද මෙම ඒකකයට අවශ්‍යතාවය පරිදි සම්බන්ධකර ගත හැකිය.
6. කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම් සාමාජිකයන් (කලාපීය දෘඩාංග හා ජාලකරණ සංචිත ගුරුභවතුන්) මෙම ඒකකයේ සම්බන්ධීකරණය යටතේ කටයුතු කළ යුතුවේ.
7. අනෙකුත් අධ්‍යාපන ආයතන සඳහාද ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් ඒකකයක් සුදුසු පරිදි ස්ථාපිත කළ යුතුවේ.

8. මෙම ඒකකයේ කාර්යභාරය,
   I. පළාතේ/කලාපයේ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් පිළිබඳ සියලු තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම.
   II. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳව සැලසුම් සකස් කිරීම.
   III. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සැපයීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය
   IV. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තුව හා අලුත්වැඩියාව සඳහා කටයුතු කිරීම.
   V. ඩිජිටල් උපාංග අලුත්වැඩියා/නඩත්තු සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

VI. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සැපයීමට අදාළව එම උපාංග ඇතුළු සියලු යටිතල පහසුකම් නිසි පරිදි සපයා ඇතිදැයි පරීක්ෂා කිරීම හා භාණ්ඩ පිළිබඳ නියාමනය කිරීම.

VII. අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ඇතුළු අධ්‍යාපන ආයතන මගින් නිකුත් කරනු ලබන උපදෙස් හා චක්‍රලේඛ අනුව තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ප්‍රවර්ධනයට අදාළ රාජකාරි ඉටුකිරීම.

VIII. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් භාවිතය සම්බන්ධව ගුරුභවතුන් සිසුන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම.

IX. පාසල් දෘඪාංග හා ජාලකරණ කණ්ඩායම් (පාසල් ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම්) ස්ථාපිත කිරීම හා එම කටයුතු සම්බන්ධීකරණය

X. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් අලුත්වැඩියාවට අදාළව ලබාදෙනු ලබන උපාංග/උපකරණ පිළිබඳව තොරතුරු පවත්වාගෙන යාම හා එම උපාංග ගබඩා අංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් පාසල්වල අලුත්වැඩියාව සඳහා නිකුත් කිරීම.

XI. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනයට අදාළව සිදුකරනු ලබන ප්‍රසම්පාදන කාර්යයන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම.

XII. පාසල්වල/අධ්‍යාපන ආයතනවල තොරතුරු තාක්ෂණ උපාංග අපහරණයට අදාළ නිර්දේශ ලබාදීම.

XIII. ඉවත් කරනු ලබන ඩිජිටල් උපකරණවලට අදාළව තවදුරටත් භාවිතයට ගතහැකි උපාංග පවතීනම්, එම උපාංග කොටස් ඉවත්කර ගැනීම, ගබඩාකර ගැනීම, එම උපාංග කොටස් පිළිබඳව තොරතුරු පවත්වාගෙන යාම හා එම උපාංග කොටස් අවශ්‍ය අලුත්වැඩියාවන් සඳහා ලබාදීම.

XIV. මෙම කාර්යය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමට යෝජිත අතර එම ස්ථාපිත කිරීම සිදුකරනු ලබන තෙක් එම තොරතුරු සුදුසු පරිදි රැස්කර තබා ගැනීම සිදුකළ යුතුවේ.

XV. විද්‍යුත් අපද්‍රව්‍ය (E–waste) පරිසර හිතකාමීව ඉවත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය

XVI. පාසල් සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය හා අන්තර්ජාල ගෙවීම් සඳහා ලබාදෙන ප්‍රතිපාදන යෝග්‍ය පරිදි ලබාදීම හා එම කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය

## 05.කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම ZDETT

1. මෙම කණ්ඩායම සඳහා මේ වන විට පළාත්/කලාපීය මට්ටමින් ස්ථාපිත දෘඩාංග හා ජාලකරණ සංචිත ගුරුභවතුන්ගෙන් සක්‍රියව දායකත්වය දක්වන මෙම රාජකාරිවල නියුක්ත සියලුම ගුරුභවතුන් ඇතුළු නිළධාරීන් අයත් වේ. මෙම කණ්ඩායමට ඉදිරියේදී විධිමත් පුහුණුවීම් ලබාදී එක් කරගනු ලබන සියලුම ගුරුවරුන් හා නිළධාරින් ද අන්තර්ගතවේ.
2. දැනට සිටින දෘඩාංග සංචිත ගුරු භවතුන් ප්‍රමාණවත් නොවන්නේ නම් අවශ්‍යතාවය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් ශාඛාව හරහා මෙම නවක සාමාජිකයින් පුහුණු කර ගැනීම සිදුකළ හැකිවේ. මේ සඳහා අවස්ථානුකූලව අවශ්‍යතාවය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැන්වීම සිදුකළ යුතුවේ.
3. මේ සඳහා ප්‍රමාණවත් පරිදි ගුරුභවතුන් තෝරාගැනීමට හැකියාවක් නොමැති අවස්ථාවලදී කලාපයේ සේවයේ නියුක්ත මෙම විෂය පිළිබඳ දැනුමක් සහිත සංවර්ධන නිලධාරීන් පුහුණු කර මෙම කණ්ඩායමේ සේවය සඳහා යෙදවිය හැක.
4. පාසලේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල පරිගණක ,පරිගණක ජාල හා ඩිජිටල් උපාංග වල පවතින දෝෂ හඳුනා ගැනීම, අලුත්වැඩියා කිරීම සහ අලුත්වැඩියා කළ නොහැකි භාණ්ඩ අපහරණය සඳහා නිර්දේශ ලබාදීම මෙම කණ්ඩායම මගින් සිදු කරයි.
5. කලාපයක් සඳහා කණ්ඩායම් අවම සාමාජික සංඛ්‍යාව 05 ක් වන අතර උපරිමය 10 කි.
6. තොරතුරු තාක්ෂණ ගුරුභවතුන් , තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරීන් හා තාක්ෂණ දැනුම සහිත ඊට උනන්දුවක් දක්වන සංවර්ධන නිලධාරීන්ද මෙම කමිටුවේ සාමාජිකයින් ලෙස විධිමත් පුහුණුවක් ලබාදීමෙන් පසු යොදා ගත හැක.

I. කලාපීය තොරතුරු තාක්ෂණ විෂයභාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉහත සඳහන් ආකාරයට සාමාජිකයින් තෝර ගැනීම හා නිර්දේශිත නාමයන් පළාත් තොරතුරු තාක්ෂණ විෂය භාර ස.අ.අ/නි.අ.අ මගින් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කිරීම සිදු කළ යුතු වේ.

II. අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ ශාඛාව/ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ශාඛාව මගින් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමෙන් පසු කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික (ZDETT) කණ්ඩායමේ සාමාජිකත්වය ලබාදීම සිදුකෙරේ. සක්‍රීයව කටයුතු නොකිරීම හා වෙනත් හේතු මත සාමාජිකත්වය අහෝසි කිරීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශ සතුය.

III. කලාප තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂගේ අධීක්ෂණය යටතේ කලාප ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ(ZDETT) කණ්ඩායමේ සාමාජිකයින්ට පමණක් 5.4 ට අදාළ කාර්යයන් සඳහා කටයුතු කිරීමට බලය පවරනු ලැබේ.

IV. මෙම කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් කාර්යයන් ඉටු කරගැනීම සඳහා විදුහල්පති විසින් සිකුරාදා දින හෝ කලාප තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන දිනයකදී සතියකට එක් දිනක් පාසල් ඉගැන්වීම් කටයුතු හා වෙනත් රාජකාරි කටයුතු වලින් නිදහස් කළ යුතුය. අදාළ කටයුතු සඳහා රාජකාරි නිවාඩු ලබා දිය යුතුවේ.

V. කලාපීය තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් විසින් මෙම කණ්ඩායමේ සාමාජිකයින්ට අදාළ කලාපයේ නිශ්චිත පාසල් සංඛ්‍යාවක් භාරදිය යුතු අතර, ඔවුන් එම පාසල් වල පරිගණක හා වෙනත් උපාංග නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතුය.

VI. වාර්ෂික/මාසික නඩත්තු හා අලුත්වැඩියා සැලස්මට අනුව අදාළ කාර්යයන් සිදුකර ඒ පිළිබඳව වාර්තාවක් සකස් කර කලාපීය තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිලධාරී වෙත ඉදිරි මාසයේ පළමු සතිය තුළ ලබා දිය යුතු වේ.

VII. අලුත්වැඩියා සඳහා ඉල්ලුම්කර ඇති පාසලක අලුත්වැඩියා කළ යුතු පරිගණක උපාංග සංඛ්‍යාව 05 කට අඩු නම් ZDETT කණ්ඩායමේ එක් සාමාජිකයෙකුද, ඊට වැඩි නම් කලාප සම්බන්ධීකරණ නිලධාරීගේ නිර්දේශය මත සාමාජිකයින් කිහිප දෙනෙකු සම්බන්ධ විය යුතුය. අමතර සහාය පාසල් ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම මගින් ලබා ගත යුතුය.

VIII. පරිගණක අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා පාසල් වලට පැමිණෙන කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායමේ (ZDETT) සමාජිකයින් ට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇති රේටයන්ට අනුව ගෙවීම් සිදුකළ යුතුය.

IX. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් තාක්ෂණික කණ්ඩායමේ සාමාජිකයන් පාසලට ලබා දුන් සේවය පිළිබඳව පාසලේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ලොග් සටහන් පොතේ සටහන් පවත්වාගෙන යායුතුය.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතන සතු සියලුම පරිගණක, පරිගණක ජාල සහ උපාංග නඩත්තුව, අලුත්වැඩියා කිරීම හා ඉවත් කිරීම සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රමවේදය පහත පරිදි වේ.

i. දෛනික නඩත්තු කටයුතු තම ආයතනය මගින් අඛණ්ඩව සිදුකරගැනීම අනිවාර්ය වේ.
ii. මෙම ආයතන සඳහා ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම සුදුසු පරිදි ස්ථාපිත කර ගත යුතුය.
iii. අලුත්වැඩියාකිරීම් හා ඉවත්කිරීමේ කටයුතු ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම (DETT) මගින් සිදුකර ගත යුතුය. එම කණ්ඩායමට සිදු කිරීමට නොහැකි කාර්යයන් ආයතනයට ආසන්න කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ (ZDETT) මගින් හෝ ජාතික මට්ටමේ ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම මගින් සිදුකර ගතයුතුවේ.මේ සඳහා ගෙවීම් 7.2.iii පරිදි විය යුතුය.

## 06. පාසල් ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් තාක්ෂණ කණ්ඩායම (SDETT)

පාසල තුළ උපාංග නඩත්තුව සඳහා තොරතුරු තාක්ෂණ ගුරුභවතා හෝ වෙනත් සුදුසුකම් සහිත ගුරුභවතුන් දෙදෙනකුගේ භාරකාරත්වයෙන් 8,9,10 ශ්‍රේණි වලින් තෝරාගත් සිසුන්ගෙන් සමන්විත පාසල් ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම පිහිටුවීම සිදුකළ යුතුය.

කණ්ඩායමේ සංයුතිය හා කාර්යභාරය :

I. මෙම කණ්ඩායමේ අවම ශිෂ්‍ය සමාජිකයින් සංඛ්‍යාව 06 කි.
II. සියලු ශිෂ්‍ය සාමාජිකයින් 8,9,10 ශ්‍රේණි වලින් තෝරා ගැනීම.
III. පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරීන් සිටී නම් ඔවුන් ද මෙම කණ්ඩායමේ සාමාජිකයන් වේ.
IV. ගුරුභවතාගේ අධීක්ෂණ යටතේ මෙම කණ්ඩායමෙන් සුළු අලුත්වැඩියා හා දෛනික නඩත්තු කටයුතු සිදුකර ගැනීම
V. පුහුණුව කලාපීය ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් තාක්ෂණ කණ්ඩායම මගින් වාර්ෂිකව ලබා දීම.
VI. මෙහි ශිෂ්‍ය සාමාජිකයින් අභිප්‍රේරණය සඳහා ඇගයීම සිදු කිරීම.
VII. පාසල තුළ උපාංග නඩත්තුව හා සුළු අලුත්වැඩියා කටයුතු හා අන්තර්ජාල පහසුකම් සඳහා පාසලේ වාර්ෂික සැලැස්මෙන් මුදලක් වෙන්කර ගැනීම.
VIII. පරිගණක විද්‍යාගාර හා අනෙකුත් උපාංග නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යාම අදාළ ඒකක භාර ගුරුභවතුන්ගේ වගකීමක් වන අතර එය පාසලේ අභ්‍යන්තර අධීක්ෂණයට ලක් විය යුතුය.
IX. පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන අත්පොතට අනුව උපාංග ඉන්වෙන්ට්‍රිගත කිරීම හා අදාළ ලිපි ලේඛන පවත්වා ගැනීම සිදු කළ යුතුවේ.
X. පාසල් මට්ටමේ පරිගණක දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම පිහිටුවීමට අදාළ 2011/19 චක්‍රලේඛයේ උපදෙස් තවදුරටත් බලාත්මක වන අතර එහි පාසල් මට්ටමේ "පරිගණක දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම" වෙනුවට "පාසල් ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායම" ලෙස සංශෝධනය විය යුතුය.

සැ.යු. : පාසල් නොවන වෙනත් අධ්‍යාපන ආයතනවල ඩිජිටල් උපාංග ඉන්වෙන්ට්‍රිගත කිරීම හා නඩත්තුව සඳහා සුදුසු ව්‍යුහයක් හා ක්‍රියා පිළිවෙලක් අදාළ ආයතනය විසින් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය.

## 07. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් නඩත්තු හා අලුත්වැඩියා වැඩසටහන ක්‍රියාත්මක කිරීම

1. මෙම වැඩසටහන අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වේ. ජාතික පාසල් හා පළාත් පාසල් සඳහා වෙන වෙනම ප්‍රතිපාදන මත 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ.
2. ජාතික පාසල් සඳහා
   I. ජාතික පාසල්වලට අදාළ නඩත්තු හා අලුත්වැඩියාව පළාත් මට්ටමින් රැස්කළ ජාතික පාසල්වලට අදාළ තොරතුරු පදනම් කර ගනිමින් සකස් කරනු ලබන නඩත්තු සැලස්මට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ශාඛාව මගින් පළාත්/කලාපීය තොරතුරු තාක්ෂණ සම්බන්ධීකරණ නිළධාරීන් හා ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායමේ සම්පත් දායකත්වය මත සිදුකරනු ලබයි.
   II. මෙම නඩත්තු සඳහා අවශ්‍යවන උපාංග අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් මිලදී ගැනීම සිදුකෙරේ. අදාළ උපාංගවලට අමතරව යම් උපාංග කොටස් අවශ්‍ය වුවහොත් අදාළ ජාතික පාසල් මගින් මිලදීගෙන ලබාදීම සිදු කළ යුතුවේ.
   III. මෙම අලුත්වැඩියාව සිදු කිරීමට අදාළව තාක්ෂණික සහය ලබාදෙන සම්පත්දායක පුද්ගල ගෙවීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින්, වැඩසටහන්/වැඩමුළු පැවැත්වීමට අදාළව සම්පත්පුද්ගලයින් සඳහා අනුමත කර ඇති රේටයන්ට අනුකූලව ලබාදීම සිදුකළ යුතුවේ. මේ සඳහා දැනට බලාත්මකව පවතින අංක EST/7/ALLOW/05/0037-4 හා EST/7/EXAMS/05/1007-6 ලිපියේ රේටයන් අදාළ කරගත යුතු අතර ඉදිරියේදි මේ පිළිබඳව සංශෝධන සිදු වේ නම් එම සංශෝධන අනුව අදාළ ගෙවීම් සිදුකළ යුතුවේ. මෙම ගෙවීම් හා අදාළ වියදම් පිළිබඳ වාර්තා තබාගත යුතුය.
   IV. අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම රහිතව වුවද කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කමිටුවේ සාමාජිකයන් මෙම අලුත්වැඩියා සඳහා සහභාගි විය හැකි අතර, අදාළ ගෙවීම් ඉහත 07 හි iii වන ඡේදය පරිදි සිදුකළ යුතුවේ.
3. පළාත් සභා පාසල්වල
   I. පළාත් පාසල්වල අලුත්වැඩියාවන් සඳහා සිදුකළ යුතු අලුත්වැඩියා හා නඩත්තු සැලැස්ම වාර්ෂිකව කලාප මට්ටමින් හා පළාත් මට්ටමින් සකස් කළ යුතුවේ.
   II. එම සැලස්මට අනුව අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග/උපකරණ වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදන පදනම් කර ගනිමින් රේඛීය අධ්‍යාපන ආමාත්‍යාංශය මගින් මිලදී ගෙන ලබාදීම හෝ අදාළ උපකරණ ලබාගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත ලබාදීම සිදුකෙරේ.

III. මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් අදාළ උපාංග/උපකරණ මිලදී ගැනීම සිදුකළ යුතුවේ.

IV. මෙම ලබාදිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණය අමාත්‍යාංශය වෙත මෙම කාර්යය සඳහා වෙන්වන මුදල් ප්‍රමාණය මත තීරණය වන බැවින් එම සමස්ත අවශ්‍යතාවයන් ඉටුකිරීමට ප්‍රමාණවත් නොවිය හැකි බැවින් පළාත් මට්ටමින් සකස් කරනු ලබන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළට ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය යටතේ මුදල් වෙන්කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ.

V. පළාත් පාසල් සඳහා පළාත්/කලාපීය මට්ටමින් සිදුකරන අලුත්වැඩියා කිරීමට අදාළව අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අදාළ අවශ්‍යතාවයන් හා පළාත්/කලාපීය ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සැලස්ම පදනම් කරගනිමින් පළාත් දෙපාර්තමේන්තු වෙත ලබාදීම සිදුවේ. පළාත් මට්ටමින් සකස් කරනු ලබන ඩිජිටල් යටිතල පහසුකම් නඩත්තු සැලස්මට අනුව එක් එක් කලාපයේ අවශ්‍යතාවය පදනම් කර ගනිමින් මුදල් ප්‍රතිපාදන කලාප කාර්යාලවලට වෙන්කර දීම සිදු කළ යුතුය.

VI. මෙම ප්‍රතිපාදන කලාපීය ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන ඒකක මගින් සිදුකරන කටයුතු සඳහා පමණක් යෙදවිය යුතුවේ.

VII. එම මුදල් ප්‍රතිපාදන භාවිතා කරමින්,

i. මෙම නඩත්තු හා අලුත්වැඩියා වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබාදෙන ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණ කණ්ඩායමේ සාමාජිකයන්ට හා සම්බන්ධීකරණ නිලධාරීන්ට අදාළ සම්පත්දායක ගෙවීම් අධ්‍යාපන අමාත්‍යාංශයේ රේටයන් අනුව සිදු කිරීම.

ii. අලුත්වැඩියා සඳහා අවශ්‍යවන සුළු පරිමාණ උපාංග හා පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම. (උදා : Diode/capciters/ඊයම් වැනි)

iii. වැඩසටහනක්/වැඩමුළුවක් ලෙස සංවිධානය නොවන පාසල්/අධ්‍යාපන ආයතන වෙත ගොස් සිදුකරන පරීක්ෂා කිරීම්/අලුත්වැඩියාවකදී ආයතන සංග්‍රහය අනුව සංයුක්ත දීමනාව හා ගමන් වියදම් දීමනාවට අදාළ ගෙවීම් සිදු කිරීම.

iv. පාසල් මට්ටමේ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් තාක්ෂණික කණ්ඩායම්වල පුහුණු වැඩමුළු පැවැත්වීම

v. ප්‍රතිපාදනවල ඉතිරියක් පවතීනම් අවශ්‍යතාවය අනුව අලුත්වැඩියාවන්ට අදාළ වන උපාංග/උපකරණ මිලදී ගැනීම.

vi. 2010-06-28 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 2010/25 අනුව වාර්ෂිකව පවත්වනු ලබන පාසල් පරිගණක විද්‍යාගාරයන්හි පවතින පරිගණක උපාංග සහ

පරිගණක ජාල නඩත්තුව සම්බන්ධයෙන් වූ ජාතික මට්ටමේ පරිගණක උපාංග හා ජාල නඩත්තු වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක වේ.

## 08. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් තොරතුරු පවත්වාගෙන යාම.

1. ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් නඩත්තුවට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම අනිවාර්යවේ. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවර්ධනය කර ලබාදෙනු ලබන මාර්ගගත පද්ධතිය මගින් අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම සිදුකළ යුතුවේ. මෙම තොරතුරු පදනම් කර ගනිමින් ලබාගනු ලබන වාර්තාව (Report) කලාපීය ඩිජිටල් යටිතල පහසුකම් නඩත්තු ඒකකය තුළ ගොනුකර තබාගත යුතු අතර ,මෘදු පිටපත් තබා ගැනීමද සිදුකළ යුතුවේ.

මෙම උපදෙස් සංග්‍රහයේ අන්තර්ගතය පිළිබඳව පැහැදිලිකර ගැනීමත් හෝ මෙම උපදෙස් සංග්‍රහය මගින් ආවරණය නොවන ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනයට අදාළව පැනනගින ගැටළුවක් පිළිබව අධ්‍යාපන අමාත්‍යාංශයේ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් ශාඛාව මගින් විමසා තීරණ ගත යුතුවේ.

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/08/26/06/08/02
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.03. 03

චක්‍රලේඛ අංක - 05/2023

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත්/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම පළාත්/ කලාප ගණකාධිකාරීවරුන්,

සියලු ම විදුහල්පතිවරුන්,

**<u>ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය</u>**

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මගින් පාසල් හා පරිගණක මධ්‍යස්ථානවල පරිගණක ආශ්‍රිත උපාංග නඩත්තුව හා අලුත්වැඩියාව සම්බන්ධයෙන් ජාතික මට්ටමේ වැඩපිළිවෙලක් 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහනට අදාළ චක්‍රලේඛ හා උපදෙස් ලිපි විවිධ අවස්ථාවන්හී දී නිකුත් කර ඇත.

02. වර්තමානයේ සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සුවිශේෂී වූ කාර්යභාරයක් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉටුකරමින් පවතින අතර මෙම කටයුතු වඩා කාර්යක්ෂමව, විනිවිදභාවයකින් හා ප්‍රශස්තව සිදු කිරිම සඳහා අවශ්‍ය උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර ඇත. එම මාර්ගෝපදේශ සංග්‍රහය මෙම චක්‍රලේඛය සමඟ අමුණා ඇත. මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුකූලව සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ ඩිජිටල් අධ්‍යාපනයට අදාළ යටිතල පහසුකම් සංවර්ධන කාර්යය ඉටු කළ යුතු වේ.

03. මෙම විෂයය සම්බන්ධව පවතින පහත සඳහන් චක්‍රලේඛ හා උපදෙස් ලිපි තවදුරටත් පහත පරිදි බලාත්මක වේ.

i. 2008.04.04 දිනැති චක්‍රලේඛ අංක 2008/14 පාසල් පරිගණක විද්‍යාගාරවල පරිගණක ආශ්‍රිත දෘඩාංග ගැටළු විසඳා ගැනීමේ චක්‍රලේඛය.

ii. ED/01/26/07/01/01 හා 2010.09.16 දිනැති කලාප මට්ටමින් පිහිටුවා ඇති දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම් සාමාජිකයන් කලාප හා පළාත් තාක්ෂණික ඇගයිම් කටයුතුවලට සම්බන්ධ කර ගැනීමේ උපදෙස් ලිපියේ "දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම් හා සාමාජිකයන්" වෙනුවට "කලාපීය ඩිජිටල් අධ්‍යාපන තාක්ෂණික කණ්ඩායම් සාමාජිකයන්" ලෙස සංශෝධනය විය යුතුය.

iii. චක්‍රලේඛ අංක 2010/23 හා 2010.06.28 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිගණක අලුත්වැඩියා කිරීමට අදාළව තත්ත්ව වාර්තා සඳහා භාවිත කරනු ලබන ආකෘතියට අමතරව මේ කාර්යය සඳහා භාවිතා කරනු ලබන මාර්ගගත පද්ධතිය මඟින් ලබාදෙන තත්ත්ව වාර්තාව ද වලංගු වාර්තාවක් ලෙස භාවිත කළ හැකිය.

04. තවද, මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ මේ සම්බන්ධව නිකුත් කර ඇති පහත සඳහන් චක්‍රලේඛ/ උපදෙස් ලිපි අභිභවා මෙම චක්‍රලේඛය හා මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් බලාත්මක වේ.

i. 2007.06.07 දිනැති ED/01/26/02/46/01 දිනැති උපදෙස් ලිපිය.

ii. 2008.04.08 හා ED/01/26/07/01/01 දිනැති උපදෙස් ලිපිය.

එම්.එන්. රණසිංහ

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

01. විගණකාධිපති
02. සියලු ම අතිරේක ලේකම්වරුන්/ අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය
03. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය
04. සියලු ම පළාත් / කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන්
05. සියලුම තොරතුරු තාක්ෂණ දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන උපදේශකවරුන්